# බෞද්ධ දර්ශනය තුළ විග්‍රහ කරන ලද ස්වභාවික සම්පත් පිළිබඳ භාරකාරත්වය සංකල්පය නූතන අන්තර්ජාතික පරිසර නීතිය තුළ වර්ධනය වීම සහ ශ්‍රී ලංකාවේ පරිසර නීතිය කෙරේ ඇතිකරන ලද බලපෑම

ඩබ්. ඒ. සනත් සමීර විජේසිංහ[1]

## හැඳින්වීම

මිනිසා සහ පරිසරය අතර පවතින අවියෝජනීය සම්බන්ධතාව මවක් සහ දරුවෙක් අතර ඇති පෙකෙණි සම්බන්ධතාව තරමටම එකිනෙක මත පරායත්ත වන සම්බන්ධතාවකි. පරිසරය තුළ වෙසෙන ජීවීන් අතුරින් සංවර්ධනයේ හිනිපෙත්තට ළඟා වූ මිනිසා විසින් අසීමිත අවශ්‍යතා තෘප්ත කරගැනීමට දරන උත්සාහයේ දී මෙකී අවියෝජනීය සම්බන්ධතාවය දිනෙන් දින අභියෝගයට ලක්වන බවත් ඉන් ඇතිවන අහිතකර ප්‍රතිඵල මගින් පරිසරයත් මිනිසාත් යන දෙපාර්ශ්වයම පීඩාවට පත්වන බවත් නොරහසකි.

> ""මිහිමත ජීවයේ ඉතිහාසය වනාහි ජීවීන්ගේ සහ ඔවුන්ගේ වටපිටාවන්හි අන්තර් සම්බන්ධතා සමූහයකින් සැදුම් ලද්දකි. වත්මන් ශතවර්ශයේ දී මිනිසා යන එකම ජීව විශේෂය පමණක් ඔහුගේ ලෝකයේ සොබාදහම වෙනස් කිරීමේ විශේෂිත බලය අත්කරගෙන ඇත්තේ ය."(කාර්සන්, 1982, 23 පිට)

වර්තමාන පරම්පරාව පමණක් ම නොව අනාගත පරම්පරාවන්ට ද ස්වාභාවික සම්පත් භුක්ති විඳීමට ඇති අයිතිය තහවුරු කළ යුතුය යන පදනම වර්තමාන අන්තර්ජාතික පරිසර නීතියේ මෙන්ම දේශීය නීතියේ ද මුල්බැසගෙන පවත්නා සංකල්පයක් වන අතර; ඒ සම්බන්ධයෙන් බල කළ භාරකාරත්වය පිළිබඳ මූලධර්මය ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වැදගත් මෙහෙයක් ඉටු කරයි.

මෙම සාර සංක්ෂේපයේ මූලික අරමුණ වන්නේ භාරකාරත්වය පිළිබඳ සංකල්පය පරිසර නීතිය තුළ දරන ස්ථිතිය කුමක් ද යන්නත් අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය තුළ දක්වන වැදගත්කමත් සලකා බලමින් බෞද්ධ ඉගැන්වීම් තුළ එය නිරූපණය වන ආකාරය විමර්ශනය කිරීමයි. දෙවනුව භාරකාරත්වය පිළිබඳ සංකල්පය බෞද්ධ දර්ශනය තුළ සාංකල්පනික වශයෙන් විස්තර කර ඇති ආකාරය සහ බෞද්ධ ඉගැන්වීම්වල හරයන් සමගින් භාරකාරත්වය පිළිබඳ සංකල්පය පරිසරය ආරක්ෂා කිරීම කෙරේ යොදාගත හැකි බවට දක්වා ඇති උදාහරණ

---

1 නීතිය පිළිබඳ කථිකාචාර්ය, නීති අධ්‍යයන අංශය, මානව සහ සමාජ ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මොනවා ද යන්න විමසා බැලිය යුතු ය. තෙවනුව අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය තුළ භාරකාරත්වය පිළිබඳ සංකල්පය අදාළ කරගැනීම කෙසේ සිදුවී ඇද්ද යන්නත් විමසිය යුතු අතර අනතුරුව පරිසරය සම්බන්ධයෙන් බෞද්ධ දර්ශනය පාරිසරික නීති විද්‍යාවේ වර්ධනයට දායක වී ඇති ආකාරය කෙබඳු ද යන්න සලකා බැලිය යුතු ය. අවසාන වශයෙන් භාරකාරත්වය පිළිබඳ සංකල්පය ස්වාභාවික සම්පත් සංරක්ෂණයේ ලා දායක කරගනු ලැබිය හැකි නූතන ප්‍රවණතාවන් කවරේ ද යන්නත් බෞද්ධ දර්ශනයේ හරයන් මෙම සංකල්පයේ වර්ධනය උදෙසා දායක කරගත හැකි ආකාරය කෙබඳු ද යන්න තුලනාත්මකව විමසා බැලිය යුතු ය.

**පර්යේෂණ ක්‍රමවේදයː**

මෙම පර්යේෂණය මූලික වශයෙන් ප්‍රාමාණික ක්‍රමවේදයක් ඔස්සේ සිදුකරනු ලබන අතර සාහිත්‍යමය විමර්ශනයක් ඔස්සේ කරුණු ඒකරාශී කිරීමක් සිදුකරනු ලබයි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් පරිසර නීතිය සම්බන්ධ අන්තර්ජාතික සම්මුතීන්, ත්‍රිපිටක ධර්මය සහ ශ්‍රී ලංකාවේ පරිසර නීතියේ මූලාශ්‍රයන් සලකා බලයි. ද්විතීයක මූලාශ්‍ර වශයෙන් නඩු තීන්දු නීතිය සහ පරිසර ආචාර ධර්ම සම්බන්ධයෙන් වන ග්‍රන්ථ විමර්ශනයට ලක්කර තිබේ.

**ප්‍රතිඵල සහ විශ්ලේෂණː**

භාරකාරත්වය (Concept of Trusteeship) සංකල්පය අන්තර්ජාතික නීතිය තුළ නීතිමය සංකල්පයක් වශයෙන් පිළිගැනීමට ලක්වන්නේ 1970 දශකයේ මුල්භාගයේ ස්වාභාවික සම්පත් පිළිබඳව අනාගත පරම්පරාවන්හි අයිතිවාසිකම් (Inter-generational Equity) ආරක්ෂා කළ යුතුය යන්න මූලධර්මයක් වශයෙන් ස්ථාපනය වීමත් සමග ය. අනාගත පරම්පරාවන් උදෙසා සම්පත් ආරක්ෂා කිරීමට නම් ඒවා භාරයක් ලෙස දැරිය යුතු බව භාරකාරත්ව සංකල්පයේ පදනමයි. භාරකරුවකුගේ කාර්යභාරය වන්නේ භාරයෙන් ප්‍රතිලාභ නොලබමින් අර්ථලාභියකුගේ ප්‍රතිලාභය උදෙසා තම දේපළක් දරන්නාක් මෙන් දැරිය යුතු වීමයි. (Weeramantry, 1992, p.151) ස්වාභාවික සම්පත් භාරයක් වශයෙන් සැළකීමේ දී අනාගත පරම්පරාව මෙන්ම නූපන් දරුවන් ද අර්ථලාභීන් ලෙස සැලකිය හැකි බව *Juan Antonio Oposa* නඩුවේදී පෙන්වා දෙන අතර රජය භාරකරුවකු වශයෙන් මෙම සීමිත සම්පත් මහජනතාවගේ අර්ථලාභය උදෙසා දැරිය යුතු ය.

මහාචාර්ය වීරමන්ත්‍රී විසින් පෙන්වා දෙන ආකාරයට ඉතිහාසය පුරාවට ආගම මගින් නීතියේ වර්ධනයට ලබා දී ඇත්තේ ඍජු හෝ වේවා වක්‍ර හෝ වේවා අපරිමිත දායකත්වයකි. (Weeramantry, 2009, p.81) බෞද්ධ දර්ශනය නීති

මූලාශ්‍රයක් වශයෙන් විශ්ව නීති දේහය තුළ කැපීපෙනෙන භූමිකාවක් රඟනොපෑව ද වර්තමාන නීති පද්ධති තුළ මහත් පිළිගැනීමට ලක්වන සමානාත්මතාව, අවිහිංසාව වැනි පදනම් රාශියක් බෞද්ධ ඉගැන්වීම් තුළ අන්තර්ගත බව විමසුම් ඇසින් බලන කල පෙනෙයි. භාරකාරත්වය මෙකී අදහස පිළිබඳ සංකල්පය අන්තර්ජාතික නීතියට ප්‍රවිෂ්ට වීම මෑත යුගයේ සිදුවූවක් වූවත් මේ අදහස චිරන්තන බෞද්ධ දර්ශනය තුළ ගැබ්වූ අවස්ථා ගණනාවක් නිදර්ශන වශයෙන් පෙන්වා දිය හැක.

බෞද්ධ දර්ශනය තුළ පෙන්වාදෙන්නේ රාජ්‍ය පාලකයා දශරාජ ධර්මයෙන් යුතුව රාජ්‍ය පාලනයේ යෙදිය යුතු බවයි. දශරාජ ධර්ම තුළ විස්තර වන ත්‍යාගශීලීත්වය, සදාචාරවත් බව, අවිහිංසාව වැනි ගුණාංගයන් පරිසරය සහ සියලුම ජීවීන් ආරක්ෂා කිරීම සඳහා පාලකයා මෙහෙයවන මාර්ගෝපදේශ වශයෙන් සැළකිය හැකිය. එමෙන්ම ශාක සහ සතුන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයකට පවතින වගකීම කූටදන්ත සූත්‍රයේ අවධාරණය කර ඇත. එපමණක් නොව පාලකයා විසින් සොබාදහමට අනුකූල නොවූ අධාර්මික පාලනයක් ගෙන යාම නිසා පවා මානව වර්ගයාගේ පැවැත්ම අභියෝගයට ලක්වන බව අධම්මික සූත්‍රයේ දක්වා ඇත. වනරෝප සූත්‍රය ආදී සූත්‍ර තුළත් අප විසින් සාකච්ඡා කරන ලද උදාහරණ තුළත් ගැබ්වී ඇත්තේ රාජ්‍ය පාලකයා විසින් ස්වාභාවික සම්පත් භාරයක් ලෙස දරමින් ආරක්ෂා කළ යුතු බවයි.

මෙලෙස බෞද්ධ දර්ශනය තුළ විග්‍රහ වන පාලකයා ස්වභාවික සම්පත්වල භාරකරුවකු වශයෙන් කටයුතු කළ යුතුය යන සනාතන උපදේශය අන්තර්ජාතික පරිසර නීති විද්‍යාව තුළ විස්තරාත්මකව සලකා බලන ලද අවස්ථාවක් *හන්ගේරි එ. ස්ලොවේකියා* නඩු තීරණය තුළ දැකගත හැක. එහි දී මහින්ද හිමියන් විසින් දේවානම්පියතිස්ස රජුට මිහින්තලාවේ දී කරන ලද පහත ප්‍රකාශය උපුටා දක්වන විනිසුරු වීරමන්ත්‍රී විසින්,

"මහරජ, අහසේ සරණ පක්ෂීන්ටත් සිවුපාවුන්ටත් ජීවත් වීමටත් මෙම භූමිය තුළ නිදහසේ හැසිරීමටත් ඔබට මෙන්ම සමාන අයිතියක් ඇත. මේ භූමියට මිනිසුන් මෙන්ම සතුන්ට ද සමානව අයිතියක් පවතියි. රජු වන ඔබ එහි භාරකරු මිස අයිතිකරු නොවේ." (Jayatilleke, 1967, P.558)

යනුවෙන් බුදු දහමේ විස්තර වන භාරකාරත්වය පිළිබඳ සංකල්පය අන්තර්ජාතික පාරිසරික නීතිය තුළ සලකා බැලීමට ලක්කර ඇත. මෙම නඩු තීන්දුව මාර්ගෝපදේශ කරගනිමින් දේශීය අධිකරණයද *බූලන්කුළම එ. කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්* (2003) නඩුවේ දී සහ සිංග්ලංකා ස්ටෑන්ඩර්ඩ් කෙමිකල් නඩුවේ දී රජය ස්වාභාවික සම්පත් සම්බන්ධයෙන් භාරකරුවකු වශයෙන් කටයුතු කර ඒවා රැකගත යුතු බව දක්වා ඇත.

උක්ත විමර්ශනයෙන් පැහැදිලි වන්නේ බෞද්ධ දර්ශනය තුළ විග්‍රහ වන පාලකයා ස්වභාවික සම්පත්වල භාරකරුවකු වශයෙන් කටයුතු කළ යුතුය යන සංකල්පය

අන්තර්ජාතික මෙන්ම දේශීය පරිසර නීතිය තුළ ද නීතිමය සංකල්පයක් වශයෙන් වටිනාකමක් සහිතව වර්ධනය වන බවයි. මෙම තත්වය තුළින් පැහැදිලි වන්නේ බෞද්ධ දර්ශනයේ පවතින සනාතනික සත්‍යතාව සහ සාර්වත්‍රික වලංගුතාව සජීව නීතියක් බිහිකිරීමේ දී මනාව උපකාර කරගත හැකිවන බවයි.

**නිගමන සහ යෝජනා**

නීතිය සහ ආගම යනු සමීප සම්බන්ධතා පවත්වන ආයතන ද්විත්වයක් වන බැවින් පිළිගැනෙන අයිතිවාසිකම් තුලනය කරන මාධ්‍යයක් වශයෙන් නීතිය යොදාගැනීමේ දී නීතිය තුළ ආගමික හරයන් පිළිබිඹු වීම වඩාත් යෝග්‍ය වෙයි. බෞද්ධ දර්ශනය තුළ විග්‍රහ වන පාලකයා ස්වාභාවික සම්පත්වල භාරකරුවකු වශයෙන් කටයුතු කළ යුතුය යන සංකල්පය පරිසර නීතිය තුළ ඇතුළත් කිරීම මගින් තරගකාරී අවශ්‍යතා සමගින් නිරන්තර ගැටීම්වලට ලක්වන සංවර්ධනය සහ පරිසරය යන සාධක තුලනය කර තිරසර සංවර්ධනය ළඟාකර ගැනීම වඩාත් කාර්යක්ෂම කරගත හැකි බවත් පෙන්වා දිය හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Jayatilleke, K. N. (1967). The Principles of International Law in Buddhist Doctrine. *Recueil des cours de l'Académie de droit international*. 120. P.558.

Weeramantry, C.G. (1992). *Nauru; Environmental Damage Under International Trusteeship.* Melbourne: Oxford University Press.

Weeramantry, C.G. (2009). *An Invitation to the Law.* 6th Ed. Colombo: Stamford Lake (Pvt.) Ltd.

කාර්සන්, රේචල් (1982) *නිහඬ වසන්තය.*

බූලන්කුළම ඒ. *කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්* 2000(3) Sri L.R. 243.